# ප්‍රබුද්ධ

## නව වන කලාපය



# ශ්‍රී ලාංකේය පුද්ගල හා සමාජීය ගැටලුවලට බෞද්ධ විසඳුම්

**ආණමඩුවේ සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සනාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අනුනායක මාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය**

සංස්කරණය
**ඇහැලේපොල මහින්ද හිමි**

මෙහි අන්තර්ගත සියලු ලිපිවල ඇතුළත් අදහස් ඒ ඒ ලේඛකයන් සතු වන බැවින් සංස්කාරකගේ අදහස් පිළිබිඹු නොවන බව සැලකුව මනාය. එමෙන්ම මෙහි අක්ෂර වින්‍යාස ලකුණු, පද බෙදීම් හා වාක්‍ය වින්‍යාස ආදිය යෙදීම ඒ ඒ ලේඛකයන්ගේ අභිමතය පරිදි සිදුකරන ලදි.

# ප්‍රබුද්ධ

**නව වන කලාපය**

**ශ්‍රී ලාංකේය පුද්ගල හා සමාජීය ගැටලුවලට බෞද්ධ විසඳුම් අංකය**

ආණමඩුවේ සද්ධර්මකීර්ති ශ්‍රී රතනපාල බුද්ධරක්ඛිත ධම්මදස්සනාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අනුනායක මාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය

© ඇහැලේපොල මහින්ද හිමි

පළමු මුද්‍රණය - ශ්‍රී බුද්ධ වර්ෂ 2564
රාජ්‍ය වර්ෂ 2020

ISBN - 978-955-30-6111-9

පරිගණක අකුරුකරණය - ඇහැලේපොල මහින්ද හිමි

කවරය නිර්මාණය - සනත් ප්‍රියදර්ශන

මුද්‍රණය - නෙත්වින් ප්‍රින්ටර්ස් (පුද්.) සමාගම,
නො. 832, ගැටඹේ, මහනුවර.
081-2386908

ප්‍රකාශනය - උඩුගම පන්සල
අස්ගිරි මහාවිහාරය
මහනුවර.

**10. මානවවාදය හා බුදුදහම** **180**
සහය කථිකාචාරිණී පී. ඒ. නදීෂානි පාලමුරේ

**11. උපැවිදිවීමේ ගැටලුවට බලපාන හේතු හා බෞද්ධ විසඳුම්** **203**
ශාස්ත්‍රපති ඇලිකේවෙල සීලානන්ද නාහිමි

**12. ගිහියා හා පැවිද්දා පිළිබඳ විවරණයක්** **230**
තාවකාලික කථිකාචාර්ය පහලගම ධම්මික හිමි

**13. රෝගීකම පිළිබඳ ගැටලුවලට බෞද්ධ විසඳුම්** **240**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගල්වැවේ විමලඛන්ති හිමි
ගෞරව ශාස්ත්‍රවේදී උල්පතගම අමිතරතන හිමි

**14. සොරකම: චෞරත්වය වැළැක්වීම පිළිබඳ බෞද්ධ දෘෂ්ටිකෝණය** **252**
කථිකාචාර්ය ගාල්ලේ ධම්මින්ද හිමි

**15. ජාතිවාදය, ජාතිකවාදය පිළිබඳ ගැටලුවට බෞද්ධ අර්ථකථනය** **266**
මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත්

**16. සම්පත් පරිභෝජන ගැටලුවට බෞද්ධ විසඳුම්** **278**
ආචාර්ය පනාමුරේ චන්දිම හිමි

**17. දුප්පත්කම නැතිකර ගැනීම සඳහා උපයෝගීවන බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ අධ්‍යයනයක්** **291**
බාහිර කථිකාචාර්ය ගිරාඳුරුකෝට්ටේ සාසනරතන හිමි

**18. යුතුකම් හා අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම** **308**
ගෞරව ශාස්ත්‍රවේදී රොටුඹ ආනන්දසිරි හිමි

**19. පවුල් ජීවිතයේ ගැටුම්වලට බෞද්ධ විසඳුම්** **330**
ගෞරව ශාස්ත්‍රවේදී කේ. ප්‍රදීපිකා මධුභාෂිණී කිරිඇල්ල

**20. සාර්ථක විවාහ දිවියකට බුදුදහමේ මගපෙන්වීම** **353**
දර්ශනපති කරඳගොල්ලේ සෝභිත හිමි

# ගිහියා හා පැවිද්දා පිළිබඳ විවරණයක්

පහලගම ධම්මික හිමි

සගාරිකව කටයුතු කරන්නා ගිහි වශයෙන් ද අනගාරිකව කටයුතු කරන්නා පැවිදි වශයෙන් හඳුන්වයි. බෞද්ධ සංස්කෘතික සන්දර්භය තුළ ගිහි පැවිදි යුග්මයක් හමුවෙයි. ඒ දෙදෙනාගේ සමාජ නියෝජන දෙකකි. පාලියෙන් ගහට්ඨ හා පබ්බජිත යනුවෙන් හඳුන්වන අතර සංස්කෘතයෙන් ගෘහස්ථ හා ප්‍රව්‍රජිත යනුවෙන් ව්‍යවහාර වෙයි. මෙම ව්‍යවහාරයට බොහෝ දීර්ඝ ඉතිහාසයක් ඇත. එය ආගමික සන්දර්භය තුළ වඩාත් අර්ථ සම්පන්න වෙයි. බුදුරදුන් සම්මා සම්බුද්ධත්වයෙන් පසුව පළමු ධර්ම දේශනය වූ ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවෙන් පසු සසුන තුළ සිවුවනක් පිරිස ඇති විය. එහි ගිහි පැවිදි යන දෙපාර්ශවය ම අන්තර්ගත වෙයි. භික්ෂු භික්ෂුණී පැවිදි පිරිසයි. උපාසක උපාසිකා ගිහි පිරිසයි. ගිහියෝ ම අගාරයෙන් වෙන් ව පැවිද්දට පත් වෙති.

ගිහි පැවිදි භේදය අන්‍යාගමික මත තුළින් බැලූ විට පැවිද්දන් ඔවුන්ගේ ආගමේ පූජ්‍ය පිරිසය. කතෝලික ආගමේ බෙහෙවින් පැවිද්දා යන්න ව්‍යවහාරයට ගෙන තිබේ. කිසියම් ආකාරයක ආගමේ හෝ දහමේ ආගමික ක්‍රියාවලිය කරවන්නෝ පැවිද්දෝ වෙති. බෞද්ධ සංස්කෘතිය තුළ පැවිද්දා යනුවෙන් පුල්ලිංගාර්ථවත්ව දැක්වූ විට සිවුරුදරාගත් කෙනෙකු පිළිබඳ චිත්‍රණයක් ඇති වෙයි. සර්වාගමික සංකල්පයෙන් බැලූ විට එය සුදු ඇඳගත් පාදිලි කෙනෙක් හෝ විය හැකිය. ඒ ඒ ආගමට අනුව පැවිදි වූ අය වෙති. ඔවුන්ගේ කාර්යභාරයන් ආගමට අනුව වෙනස් වෙයි. බුදුදහමේ පැවිද්දා නම් භික්ෂුවයි. භික්ඛු

හෝ භික්ෂු යන්න ජාති නාමයකි. භික්ෂුව නම් ගිහි ගෙයින් නික්මී සසුන වෙත පැමිණ සසුන් පිළිවෙතෙහි පිළිවෙත් පුරණ උතුමාය. උන්වහන්සේට නිශ්චිත කටයුත්තක් ඇත්තේය. හුදෙක් සසර විමුක්තිය උදෙසා යොමු සිත ඇති බැවින් සීල සම්පන්නය. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයෙහි වාසය කරයි. ධර්මානුකූල හැසිරීම් හා ගෝචරයෙන් යුක්තය. අණු මාත්‍ර වරදෙහි පවා බිය දකියි. සිල් සමාදන් වී හික්මෙයි. කායවාග්කර්මයෙන් සමන්විත වූයේ වෙයි. එහෙයින් ම පිරිසිදු ආජීව ඇත්තේ වෙයි. සිල්වත් වූයේ ඉන්ද්‍රියයන්හි වැසූ දොර ඇත්තේ වෙයි. බොජුන්හි පමණ දන්නේය. සිහියෙන් හා නුවණින් යුක්ත වූයේය. සිවුපසයෙහි තුන්වැදෑරුම් සතුටින් සතුටු වූයේය. ශික්ෂාපදයන්හි සමාදන් වන්නේ හික්මෙයි.[1] 'භික්ඛු' යන්න පිළිබඳව නිර්වචන රාශියක් හමුවෙයි. එයින් භික්ෂුව යනු කුමන භූමිකාවක් ඇති කෙනෙක්දැයි පැහැදිළි කොට ගත හැකිය.

- භික්ඛූති භික්ඛකොති භික්ඛු (සිඟා යන්නේ භික්ඛු නම්)
- භික්ඛාචරියං අජ්ඣුපගතොති භික්ඛු (භික්ෂාටනයට පැමිණියේ භික්ඛු නම්)
- භින්නපටධරොති භික්ඛු (බුන් වත් දරාන්නේ භික්ඛු නම්)
- සමඤ්ඤාය භික්ඛු (ව්‍යවහාර මාත්‍රයෙන් කිසිවෙක් භික්ඛු නම් වේ)
- පටිඤ්ඤාය භික්ඛු (ප්‍රතිඥා මාත්‍රයෙන් කිසිවෙක් භික්ඛු නම්)
- එහි භික්ඛූති භික්ඛු (එහි භික්ඛු යන්නෙන් භික්ෂු භාවය ලැබී ද භික්ඛු නම්)
- තීහි සරණගමනෙහි උපසම්පන්නොති භික්ඛු (තිසරණගමනයෙන් උපසපන් වූයේ භික්ඛු නම්)

- භද්‍රොභික්ඛු (භද්‍ර වූ ශීලාදි පඤ්ච ධර්මයන්ගෙන් යුක්ත වූයේ භික්ඛු නම්)
- සාරො භික්ඛු (ශීලසාරාදියෙන් ම යුක්ත වූයේ භික්ඛු නම්)
- සෙඛො භික්ඛු (හික්මෙන්නේ භික්ඛු නම්)
- අසෙඛො භික්ඛු (හික්මීම අවසන් කෙළේ භික්ඛු නම්)
- සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නොති භික්ඛු (සමගි වූ සඟන විසින් අකෝප්‍ය වූ ශාසනයට සුදුසු වූ ඤත්තිචතුත්ථ කර්මයෙන් උපසපන් කරණ ලද්දේ භික්ඛු නම්)
- තත්‍ර ය්වායං භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන ඤත්තිචතුත්ථෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන උපසම්පන්නො අයං ඉමස්මිං අත්ථො අධිප්පෙතො භික්ඛූති.[2] (එහි යම් ඒ මහණෙක් සමගි සඞ්ඝයා විසින් අකෝප්‍ය වූ ශාසනයට සුදුසු වූ ඤත්තිචතුත්ථ කර්මයෙන් උපසපන් කරණ ලද්දේ වේ ද මේ තෙමේ භික්ඛු යයි අදහස් කරණ ලද්දේ ය)

මජ්ඣිම නිකයේ එන රට්ඨපාල තෙරුන්ගේ චරිත විස්තරය දෙසූ බැලූ විට පෙනී යන්නේ ගිහි දිවියෙහි රාජකුමාරයකු වශයෙන් ජීවත් වූ ඔහු ගිහි දිවිය කලකිරෙයි. චුල්ලකොට්ඨිත ගමේ ප්‍රධානියාගේ පුතා රට්ඨපාල නම් විය. ඔහු කල්පනා කරන්නේ සසර දුකින් නිදහස් වීමට ගිහි ගෙය සම්බාධක සහිතය ඒ නිසා බ්‍රහ්මචර්යාවෙහි හැසිරීමට පැවිදි විය යුතුයි. යනුවෙනි. ඒ සඳහා සුදුසු වූ ක්‍රියා පිළිවෙතත් කල්පනා කරයි. ''නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිතං බ්‍රහ්මචරියං චරිතුං, යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජයෙය්‍යන්ති''[3] වශයෙන් ගිහි ගෙදරින්

නික්මීමත් කාසාය වස්ත්‍ර දැරීමත් කෙස් රැවුළු ඡේදනයත් සිදු කළ යුතු බව සිතයි. එසේ ම පැවිද්ද සඳහා වූ ක්‍රියා පිළිවෙත සිදු කොට පැවිද්ද බුදුරදුන් වෙතින් ඉල්ලා සිටියි. නමුත් මව් පියන්ගේ අවසරය නොමැති නිසා බුදුරදු වෙතින් අවසර නොලැබෙයි. මව් පිය අවසරය අවශ්‍ය බව දැන්වූ විට එකී අවසරය සඳහා කටයුතු කරයි. රට්ඨපාලට පැවිද්දට මව් පිය අවසරය ලැබෙන්නේ දිවිපරදුවට තබා කළ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙනි. රට්ඨපාල කෙසේ හෝ බුදුරදුන් හමුවේ පැවිදි බවට පත් වී සකල ක්ලේෂයන්ගෙන් විනිර්මුක්ත වීමට මාර්ගය උදාකර ගනියි. එසේ ම සසුනෙහි ශ්‍රද්ධාවෙන් පැවිද්දට පත් වූවන් අතර අග්‍රස්ථානය ද රට්ඨපාල හිමියෝ ලැබූහ. මෙහි වැදගත් වන්නේ රට්ඨපාල හිමියන් සසුනෙහි පැවිද්දට පත් වීම සඳහා ගිහියෙකු වශයෙන් සිදු කළ මානසික පරිවර්තනයයි. එය රට්ඨපාල හිමියන් කොරව්‍ය රජු විසින් ප්‍රශ්න කළ අවස්ථාවේ පැහැදිලි කරන්නේ මෙසේය. මෙම කරුණු හතර සූත්‍රයේ ධම්මුද්දේස (චත්තාරො ධම්මුද්දෙසා) යනුවෙන් හඳුන්වා තිබේ.

- උපනීයති ලොකෙ අද්ධුවො බො මහාරාජ
- අත්තාණො ලොකො අනභිස්සරො බො මහාරාජ
- අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයන්ති බො මහාරාජ
- ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො බො මහාරාජ[4]

ලෝකය ජරා මරණ කරා ගමන් කරන බව දැන පැවිදි බවට පත්වීම. අනිත්‍ය ස්වභාවය පිළිබඳ ඇති වෙන්නා වූ දැනුම මෙයින් පැහැදිලි වෙයි. තමාට ගෘහස්ථවාසයෙන් ජරා මරණ ඉක්මවීමට අපහසු බැවින් පැවිද්ද ඊට සුදුසු ස්ථානය වශයෙන්

තෝරාගත් බව පෙනෙයි. ලෝකයෙහි වෙනයම් අධිකාරී බලවේගයක් ක්‍රියාත්මක නොවන බව දැනගැනීම. තමාගේ සුද්ධි හෝ අසුද්ධි සිදු කළ යුත්තේ තමාම බව දැන ගැනීම. තමා බ්‍රහ්මචර්යාවෙහි නිරත වී අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කිරීම විමුක්තියට මාර්ගය බව මෙයින් අර්ථවත් වෙයි. ලෝකයේ භෞතික අභෞතික සියලු දෑ තමාට අයිති නොවන බවත් සියල්ල අතහැර යා යුතු බවත් දැන ගැනීම. කොපමණ එක් රැස් කළත් ඒවා කිසියම් අවස්ථාවක හැර දමා මරණයට පත්විය යුතු බව. රැස්කිරීමට වඩා අත්හැරීමේ සංතෘප්ත වී පරම සුඛයට පත්වීම මෙයින් අවධාරිතය. කොපමණ දෑ ලැබුණත් තෘප්තියක් ඇති වීමක් සිදු නොවීම හා ආශාවේ කෙළවරක් නොවීම. යන කරුණු පිළිබඳ හරිහැටි ක්‍රියාත්මක වීමට ගිහි බව අපහසු වෙයි. නමුත් නොහැකි නොවේ. එහි දුෂ්කර බව නිසා අදාළ පිළිවෙත් පිරීමට පැවිද්ද යහපත් ස්ථානයක් වෙයි. ''සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති''. මේ සූත්‍රයේ කරුණු හතර ගිහි හා පැවිදි බව අර්ථකථනය කර ගැනීමට සුදුසු සීමාවන් වෙයි.

ගිහි පැවිදි සම්බන්ධය සාසනික වශයෙන් අවිච්ඡින්නව බැඳී පවතී. සසුන ආරක්ෂාවීම කෙරේද බෙහෙවින් බලපානු ලබන්නේ ගිහි පැවිදි සම්බන්ධ යි. වර්තමානය වන විට එකී සම්බන්ධය ආරාමගත වූ පැවිද්දට අවශ්‍යම කාරණයක් බවට පත්වී තිබෙන බව පෙනෙයි. චීවරාදි ප්‍රත්‍ය දෙන ගිහියන් පැවිද්දන්ට උපකාර කරන බවත් ධර්මානුසාසනා කරන පැවිද්දන් ගිහියන්ට උපකාර කරයි. ඒ බව මෙසේ ඉතිවුත්තකපාළියේ සඳහන් වෙයි.

"සාගාරෙසු ච චීවරං පච්චයං සයනාසනං,
අනගාරා පටිච්ඡන්ති පරිස්සයං විනොදනං.

සුගතං පන නිස්සාය නිස්සාය ගහට්ඨා ඝරමෙසිනො,
සද්දහානා අරහතං අරියපඤ්ඤාය ඣායිනො.

ඉධ ධම්මං චරිත්වාන මග්ගං සුගතිගාමිනං,
නන්දිනො දෙවලොකස්මිං මොදන්ති කාමකාමිනො."[5]

ගිහි පැවිදි දෙපක්ෂය ම දුකින් මිදෙන්නේ අන්‍යෝන්‍ය සම්බන්ධයෙනි. ගිහි පැවිදි සම්බන්ධය පවත්වා ගෙන යා යුත්තේ කෙසේදැයි සිගාලක සූත්‍රයේ පැහැදිලි කරයි. දිසා වැඳීම පිතුභාසයක් වශයෙන් ක්‍රියාවට නැංවූ සිගාලක ගහපතියාට උඩ දිසාව පැවිද්දන් වශයෙන් යට දිසාව ගිහියන් වශයෙන් බෙදා වෙන් කොට ඔවුනොවුන් කෙරෙහි විශ්වාසයෙන් ස්වකීය යුතුකම් ඉටු කළ යුතු බව පෙන්වා දී තිබේ.[6] ගිහියන් විසින් පැවිද්දන් කෙරෙහි ක්‍රියාත්මක විය යුත්තේ මේ ආකාරයෙහි.

01. මෙත් සිත් සහිතව ක්‍රියාත්මක වීමෙන් (මෙත්තෙන කායකම්මෙන)
02. මෙත් සිත් සහිත වචනයෙන් (මෙත්තෙන වචීකම්මෙන)
03. මෙත් සහිත මනසින් (මෙත්තෙන මනොකම්මෙන)
04. දොර නොවැසීමෙන් (අනාවටද්වාරතාය)
05. ආහාර පාන දීමෙන් (ආමිසානුප්පදානෙන)

පැවිද්දා කෙරෙහි මෙසේ ගිහියාගේ මැදිහත්වී සිදු ම වීමෙන් ගිහි පැවිදි සම්බන්ධතාවය පළඳු නොවී ක්‍රියාත්මක

වෙයි. අන්‍යෝන්‍ය සුහදත්වය පවතී. ගිහියාවෙතින් පමණක් ක්‍රියාත්මක වී ප්‍රමාණවත් නොවේ. එහි දී පැවිද්දාත් කරුණු හයක් ගිහියා කෙරෙහි ක්‍රියාත්මක කරවිය යුතුයි.[7] එනම්,

01. පවින් වළකාලති (පාපානිවාරෙන්ති)
02. පිනෙහි යොදවති (කළ්‍යාණෙ නිවෙසෙන්ති)
03. කළණ සිතින් අනුග්‍රහ කරති (කළ්‍යාණෙන මනසා අනුකම්පන්ති)
04. නො ඇසූ දහම් අස්සවති (අස්සුතං සාවෙන්ති)
05. අසා ඇති දෑ පිරිසිදු කරවති (සුතං පරියොදපෙන්ති)
06. සුගති මාර්ගය කියති (සග්ගමග්ගං ආචික්ඛන්ති)

මේ ආකාරයෙන් පැවිද්දන් විසින් ක්‍රියාත්මක වීමෙන් අන්‍යෝන්‍ය සම්බන්ධතාව සසුන රක්‍ෂාවීම අදිය සිදු වෙයි. ගිහි පැවිදි සම්බන්ධය කෙසේ පවත්වා ගත යුත්තේ ද යන්න මෙයින් පැහැදිලි වෙයි.

පැවිද්ද ගිහියෙකුට ලබා දෙන්නේ විනයානුකූල ක්‍රියාවන්ට අනුකූල වෙමිනි. සමාජයේ සිටින ඕනෑ ම පුද්ගලයකුට පැවිදි විය නොහැකිය. පැවිද්දට පත් කළ හැකි වසයසක් ද ඇත. දරුවකු නම් කපුටකු එලවා ගත හැකි වයස වේ. පැවිදි නො කළ යුතු පුද්ගලයන් මෙසේ දැක්විය හැකිය. 1. කපුටකු එලවා දැමිය නොහැකි වයසෙහි සිටින දරුවන් 2. කුෂ්ට, දද, ගෙඩි, වණ, ඇදුම, අපස්මාරය වැනි රෝග වලින් පෙළෙන පුද්ගලයන් 3. රාජ භටයන් 4. ප්‍රසිද්ධ සොරුන් 5. හිරගෙයින් පැන ගිය අපරාධ කරුවන් 6. අධිකරණයෙහි නම ලියවුණ අපරාධකරුවන් 7. වරදට කසයෙන් තලනු ලැබූ පුද්ගලයන් 8. සිරුරෙහි සලකුණු තබා දඬුවම් කළ පුද්ගලයන්

9. ණයකරුවන් 10. දාසයන් 11. මවුපියන්ගෙන් අවසර නොලැබූවන් 12. අතක් නැති පුද්ගලයන් 13. පයක් නැති පුද්ගලයන් 14. අත් පා දෙකම නැති පුද්ගලයන් 15. කනක් නැති පුද්ගලයන් 16. නහය නැති පුද්ගලයන් 17. කණ සහ නහය නැති පුද්ගලයන් 18. ඇඟිලි අග සිඳුණු පුද්ගලයන් 19. ඇඟිලි සිඳුණු පුද්ගලයන් 20. මහ නහර සිඳුණු පුද්ගලයන් 21. ඇඟිලි එකට බැඳී ඇති පුද්ගලයන් 22. කුදු පුද්ගලයන් 23. මිටි පුද්ගලයන් 24. බෙල්ලෙහි ගෙඩි ඇති පුද්ගලයන් 25. බරවා රෝගය ඇති පුද්ගලයන් 26. පාප රෝග ඇති පුද්ගලයන් 27. පිරිස් මැද කැපී පෙනෙන විරූපී පුද්ගලයන් 28. එක් ඇසක් ඇති පුද්ගලයන් 29. අත් පා ඇදවූ පුද්ගලයන් 30. කොරුන් 31. සිරුරෙන් අඩක් පණ නැති පුද්ගලයන් වශයෙන් පැවිද්දට පත් නොකළ යුත්තෝ වෙති. මෙයින් පෙනී යන්නේ පැවිද්ද කිසියම් ක්‍රමයක් ඔස්සේ නිර්වාණගාමී මාර්ගයට පිවිසීමට කිසිදු අපහසුවක් නොවන සේ පැවිදි දිවිය සකස් කොට ඇති බවයි.

පැවිදි බවට පත් වූ විට පැවිදි දිවිය ගත කළ යුත්තේ ශීල සංවරයෙන් වෙයි. කිසියම් අවස්ථාවක සිල් භින්න වී යා හැකිය. සමහර විට එසේ උවහොත් ගිහි බවට පත්විය හැකිය. ඒ නිසා විශේෂයෙන් පැවිද්දා විසින් ගිහි දිවිය දෙස බැලිය යුත්තේ කුමන ආකාරයෙන්දැයි චන්ද්‍රූම සූත්‍රයේ අගනා උපදෙස් අන්තර්ගත වෙයි. ''ගිහි ගෙයින් කය ඉවත් කරගෙන සිත ඉවත් කරගෙන සියලු කල සඳ මෙන් ආගන්තුකව ගිහියන් කරා එළඹෙව්. ගිහි ගෙවල්වල ඇළුනෝ නොවව්. පාලු ළිඳකට හෝ පර්වතප්‍රාන්තයකට හෝ ගං ඉවුරකට හෝ එබී බලන්නේ එයට නොවැටෙනු පිණිස කය හා සිත ඉන් ඉවත් කර ගෙන පසු පසට බර වී යමක් බලන්නේ ද එසේ සඳ මෙන් ගිහියන් ගරා එළඹෙව්''[8] යනුවෙනි. මෙහි දී ගිහි බව කෙරෙහි පැවිද්දා

ක්‍රියාත්මක විය යුතු ආකාරය පැහැදිලි වෙයි. ගිහි කාමභෝගී ජීවිතය පිළිබඳ පැවිදි දිවියේ සිට කටයුතු කළ යුත්තේ මෙබඳු ආකාරයෙනි. එසේ වූ විට උපැවිද්ද යන්න අර්ථ ශූන්‍ය ක්‍රියාවක් නොවෙයි.

පින් පව් කුසල් අකුසල් ගිහි පැවිදි කාහට උවත් බලපානු ලබයි. නිවන ගිහි පැවිදි උභය දිවිය සඳහාම බුදුදහම අනුදැන තිබේ. ගිහි බව හා පැවිදි බව නිර්වාණගාමී මාර්ගයේ දී ආකාර දෙකකට බලපානු ලබයි. නිවන් මාර්ගයට පැවිදි දිවය පහසු වන අතර ගිහි දිවිය දුෂ්කරතා මධ්‍යයේ ගමන් කළ යුතු වෙයි. මුනි සූත්‍රයේ ඒ බව දක්වා ඇත්තේ මෙසේය.

"සිඛී යථා නීලගීවො විහංගමො
හංසස්ස නොපෙති ජවං කුදාචනං,
එවං ගිහී නානුකරො භික්ඛුනො
මුනනො විචිත්තස්ස වනම්හි ඣායතොති"[9]

පිල් බර ඇති මොනරාට හංසයා මෙන් ක්‍රියාත්මක විය නොහැකිය. ගිහියාගේ නිවන් කරා යන මාර්ගය විවිධ දුෂ්කරතා මධ්‍යයේ ගමන් කළ යුතු වෙයි. එසේ උවත් පැවිද්දාට හංසයා සේ පහසුවෙන් නිවන් කරා ගමන් කළ හැකිය. ගිහි උවත් පැවිදි උවත් නිවන කරා ගමන් කිරීම සසර දුක නිවාලන්න හේතු වනු ඇත. ගිහි දිවිය ගත කරන්නෝ සර්ව අසුභවාදයෙහි පිහිටා ක්‍රියා කළ යුත්තෝ නොවන්නාහ. දිවිය සර්ව සුභවාදයෙහි සිට ධර්මානුකූල ප්‍රතිපදාවක දිවිය ගෙවිය යුත්තෝ වන්නාහ. ගිහි ජීවිතය සැපයෙන් කම් සැප විඳිය යුතුය. එහි ඇලිය යුතු නොවෙයි. එහි ආදීනව දැක ආශ්වාදනය සිදු කිරීමෙන් ගැටම්වලින් තොරව දිවිය ගත කළ හැකිය. පැවිදි දිවිය

පඤ්චකාමයෙන් වෙන් වී සබ්බ දුක්ඛ නිස්සරණ සච්චිකරණත්ථාය යන්න සඳහා ක්‍රියාත්මක විය යුතුයි. ගැටුම් බැඳුම් නැත දිවිය තෘප්තිකරය. සුඛ සහගතය. එය පරම සුඛය සඳහා ක්‍රියාත්මක කර විය හැකිය.

## ආන්තික සටහන්

---

1. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූක. සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො, සන්තුට්ඨො. දීඝ නිකාය i, සාමඤ්ඤඵල සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව, 2006, 2006. පි. 100.
2. පරාජිකපාළි i භාගය, බු:ජ:මු: පි. 56.
3. මජ්ඣිමනිකාය ii භාගය, රාජවග්ගය, රට්ඨපාල සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව 2006, පි. 420.
4. එම, පි. 440.
5. ඉතිවුත්තකපාළි, බහුකාර සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව 2006, පි. 470.
6. පඤ්චහි ඛො ගහපති පුත්ත ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨා තබ්බා. දීඝ නිකාය iii භාගය, සිගාලක සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව, 2006, පි. 308.
7. එම, ඉමෙ ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි කුපුත්තෙන උපරිමාදිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා ඡහි ඨානෙහි කුලපුත්තං අනුකම්පති.
8. චන්ද්‍රූපමා භික්ඛවෙ කුලානි උපසංකමථඅපකස්සෙව කායං, අපකස්සෙව චිත්ත, නිච්චනවකා කුලෙසු අප්පගබ්භා, සෙය්‍යථාපි භික්ඛවෙ, ජරුදපානං වා ඔලොකෙය්‍ය පබ්බතවිසමං වා නදී වා විදුග්ගං වා අපකස්සෙව කායං අපකස්සෙව චිත්තං එවමෙව ඛො භික්ඛවෙ, චන්ද්‍රූපමා කුලානි උපසංකමථ අපකස්සෙව කායං අපකස්සෙව චිත්තං කුලෙසු අප්පගබ්භා, සංයුත්ත නිකාය ii, කස්සප සංයුත්තය, චන්ද්‍රූප සුත්ත, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව, 2006, පි. 302.
9. සුත්තනිපාතය, මුනි සුත්ත, 223 ගාථාව, බුද්ධ ජයන්ති මුද්‍රණ ග්‍රන්ථ මාලාව 2006, පි. 66.